සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

| 21 | S | II |
|---|---|---|

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education, Southern Province

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
## கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
## General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

| 13 ශ්‍රේණිය<br>Grade 13 | ආර්ථික විද්‍යාව - II<br>Economics - II | පැය තුනයි<br>Three hours |
|---|---|---|

සැලකිය යුතුයි :
- 'අ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- අමතර කියවීම් කාලය විනාඩි 10

අමතර කියවීම් කාලය විනාඩි 10

### "අ" කොටස

(01) i. අ) නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

ආ) ප්‍රාග්ධනය වෙනත් නිෂ්පාදන සාධක වලින් වෙන්කර හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණ කවරේද?

ii. අ) "ආදායම් ව්‍යාප්තිය" පිළිබඳ ගැටලුව හඳුන්වන්න. (ලකුණු 02)

ආ) මෙම ගැටලුව විසඳා ගැනීමේදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය සහ සැලසුම් ආර්ථික පද්ධති එකිනෙකින් වෙනස් වන ආකාරය පහදන්න. (ලකුණු 02)

iii. සිරස් අක්ෂයේ එළවළු සහ තිරස් අක්ෂයේ ඇඟළුම් යන භාණ්ඩ දෙක දක්වෙන වැඩිවන ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර යොදා ගනිමින් පහත සිදුවීම් නිරූපණය කර පැහැදිලි කරන්න. (ලකුණු 02)

අ) දේශපාලන අස්ථාවරභාවය නිසා විදේශිකයන් ඇඟළුම් කර්මාන්තයේ ආයෝජන ඉවත් කර ගැනීම

ආ) ආනයනික යෙදවුම් මිල ගණන් ඉහළයාම නිසා ඇඟළුම් නිෂ්පාදනය අඩුවීම

ඉ) එළවළු නිෂ්පාදනය සඳහා යෙදවුම් අවශ්‍යතාව පෙරට වඩා අඩුවීම

ඊ) රජයේ නව සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ශ්‍රම සේවා වියුක්තිය පහත වැටීම

උ) රැකියා වෙළඳපොළ සම්බන්ධ ගැටළු හේතුවෙන් ශ්‍රමිකයන්ගේ බාහිර ශුද්ධ සංක්‍රමණය ඉහළ යාම (ලකුණු 5 × 2 = 10)

iv. "ආර්ථික කාර්යක්ෂමතාවය" නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ඕනෑම ලක්ෂයකින් පෙන්නුම් කළහැක. ඉහත ප්‍රකාශයට එකඟවිය හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02)

(02) i. මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම අනුව මිල ඉල්ලුම් නම්‍යතා ප්‍රභේද දක්වන්න. (ලකුණු 04)

ii. වෙළෙඳපොළ "සැපයුම" තීරණය කරන සාධක කවරේද? (ලකුණු 04)

iii. "පාරිභෝගික අතිරික්තය" හා නිෂ්පාදන අතිරික්තය" අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)



Scanned by CamScanner

iv. පොල් සඳහා වන තරඟකාරී වෙළෙඳපොලකට අදාළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$Qd = 24-4p$ (ඉල්ලුම් සමීකරණය)

$Qs = 4p$ (සැපයුම් සමීකරණය)

අ) ඉහත සමීකරණ වලට අදාළ අධි ඉල්ලුම් සමීකරණය හා අධි සැපයුම් සමීකරණය සොයන්න. (ලකුණු 02)

ආ) අධි ඉල්ලුම් හා අධි සැපයුම් සමීකරණ ඇසුරෙන් සමතුලිත මිල සොයන්න. (ලකුණු 02)

v. පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කිරීමට ගැලපෙන වචනය යොදන්න.

| | මිල ඉල්ලුම් නම්‍යතාව | මිල වෙනස්වීම | පාරිභෝගික පැහැදුම |
|---|---|---|---|
| අ) | - 0.3 | වැඩිවේ | ........................ |
| ආ) | - 1.2 | ........................ | අඩුවේ |
| ඉ) | - 0.5 | ........................ | අඩුවේ |
| ඊ) | - 1.0 | වැඩිවේ | ........................ |

(03) i. තරඟකාරී වෙළෙඳපොලක අලෙවි වන X භාණ්ඩයේ ප්‍රමාණය ඒකක 80 දී සැපයුම් මිල රුපියල් 16 කි. ප්‍රමාණය 80 දී රුපියල් 48 ක අධි ඉල්ලුම් මිලක් පවතී. භාණ්ඩයේ සැපයුම් නම්‍යතාවය ධන 1කි. මිල රුපියල් 48 දී ඉල්ලුම් ප්‍රමාණය 160ක් වේ. භාණ්ඩයේ ඉල්ලුම් සැපයුම් වක්‍ර සරල රේඛීය වේ.

අ) ඉහත දත්ත උපයෝගීකරගෙන ඉල්ලුම් සැපයුම් වක්‍ර නිර්මාණය කර සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය දක්වන්න. (ලකුණු 04)

ආ) සෑම භාණ්ඩ ඒකකයක් සඳහාම රුපියල් 8/- නිෂ්පාදන සහනාධාරයක් රජය ලබාදුනහොත් සහනාධාරයෙන් පසු නව සැපයුම් වක්‍රය රූප සටහනෙහි නිර්මාණය කර සහනාධාරයෙන් පසු ගැනුම්කරුගේ මිල සහ සැපයුම්කරුගේ මිල ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

ඉ) නිෂ්පාදන සහනාධාරයෙන් පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට ලැබෙන වාසිය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

ii. නිදහස් තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන එක් භාණ්ඩයක් පිළිබඳ තොරතුරු පහත ඉල්ලුම් සැපයුම් සමීකරණය මගින් ඉදිරිපත් වේ.

$Qd = 30 - 2P$

$Qs = -2 + 2P$

අ) නිෂ්පාදකයින් නගාසිටුවීම සඳහා භාණ්ඩයේ සහතික මිල රුපියල් 10/- ලෙස ලබාදීමට රජය තීරණය කරයි. සහතික මිලට ප්‍රතිචාර දක්වමින් නිෂ්පාදකයෝ උපරිම ප්‍රමාණය වෙළෙඳපොළට සපයන්නේ නම් එම ප්‍රමාණය කොපමණද? (ලකුණු 02)

ආ) සහතික මිල ක්‍රමය යටතේ උපරිම ප්‍රමාණය වෙළෙඳපොළට සපයන්නේ නම් වෙළෙඳපොළෙහි ක්‍රියාත්මක වන මිල කොපමණ ද? (ලකුණු 02)

ඉ) මිල ආධාරක ප්‍රතිපත්තියක් ලෙස ඌන පූර්ණ ගෙවීම් ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ නම් ඒ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 02)



Scanned by CamScanner

iii. නිදහස් තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන පාරිභෝගික භාණ්ඩයක මිල ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වේ. රජය විසින් එම භාණ්ඩය මත පාරිභෝගික වැට් බද්දක් පනවනු ඇත. බද්දෙන් පසු තත්ත්වය රූප සටහනකින් ඉදිරිපත් කරන්න. ගැනුම්කරුගේ මිල, සැපයුම්කරුගේ මිල, බද්දේ ප්‍රමාණය රූප සටහන උපයෝගී කරගෙන ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(04) i. අ) ව්‍යාපාර ආයතනයක ගණකාධිකාරී ලාභ ආර්ථික ලාභ වලට වඩා වැඩි වේ. පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) හීනවන ඵල නීතිය අර්ථ දක්වන්න. එම නීතිය පදනම් කරගනු ලබන උපකල්පන කවරේද? (ලකුණු 03)

ii. පූර්ණ තරඟ ව්‍යාපාර ආයතනයක භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 03)

iii. පූර්ණ තරඟ ව්‍යාපාර ආයතනයක් කෙටිකාලයේදී ආන්තික අයභාරය, ආන්තික පිරිවැයට සමාන වන එක් අවස්ථාවකදී අතිප්‍රාමාණික ලාභ (ආර්ථික ලාභ) ලබන ආකාරය රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. අ) ඒකාධිකාරී තරඟ වෙළෙඳපොලෙහි මූලික ලක්ෂණ දක්වන්න. (ලකුණු 02)

ආ) ස්වභාවික ඒකාධිකාරය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

ඉ) පූර්ණ තරඟ ආයතනයක ආර්ථික ලාභ ශුන්‍ය මට්ටමක පැවතියත් නිෂ්පාදන ආයතන අඛණ්ඩව නිෂ්පාදනයෙහි යෙදී සිටීම ආයතනයකට සතුටුවිය හැකි තත්ත්වයකි. එකඟ වන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(05) i. දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික ආදායම අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. දෙන ලද වර්ෂයක එක්තරා ආර්ථිකයක ජාතික ගිණුම් ආශ්‍රිත දත්ත සමූහයක් පහත දක්වේ. (වටිනාකම රුපියල් මිලියන)

| | |
|---|---|
| සේවක ආදායම් | 14000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 9000 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 1000 |
| මිශ්‍ර ආදායම් | 800 |
| නිෂ්පාදන මත අයකළ වෙනත් බදු | 700 |
| ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | 2500 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | 1100 |
| නිෂ්පාදනය මත ලබාදුන් වෙනත් සහනාධාර | 200 |
| භාණ්ඩ හා සේවා මත බදු - සහනාධාර | 5900 |

පහත දෑ ගණනය කරන්න.

අ) දළ දේශීය නිෂ්පාදිතය

ආ) දළ ජාතික ආදායම

ඉ) වැයකළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 06)



Scanned by CamScanner

iii. "හරිත ජාතික ගිණුම්කරණය තිරසර සංවර්ධනය හා බැඳුනු සංකල්පයකි" ඒ අනුව හරිත දළ ජාතික දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

iv. සම්ප්‍රදාන වියදම් යනු කුමක් ද? ඊට ඇතුළත් සංරචක කවරේද? (ලකුණු 02)

v. කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 600 + 0.8 yd වන අතර එම ආර්ථිකයට අදාල පහත තොරතුරු ඔබට දී ඇත. (රුපියල් මිලියන)

| | | |
|---|---|---|
| ස්වාධීන බදු | (T) | 250 |
| ශුද්ධ අපනයන | (Nx) | -100 |
| ආයෝජන | (I) | 200 |
| රාජ්‍ය වියදම | (G) | 300 |
| අපනයන | (x) | 200 |

අ) කාන්දුවීම = වද්දීම (W = J) ප්‍රවේශයට අනුව අදාල ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 04)

ආ) මෙම ආර්ථිකයේ බදු අයකිරීම් රුපියල් මිලියන 300 දක්වා ඉහළ නංවනු ලැබුවහොත් සමතුලිත ජාතික ආදායමට වන බලපෑම ගුණිත සංකල්පය යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

## "ආ" කොටස

(06) i. ව්‍යවහාර මුදල්, බැංකු මුදල් සහ විද්‍යුත් මුදල් අතර වෙනස පැහැදිලිව දක්වන්න. (ලකුණු 06)

ii. මුදලේ අගය යනු කුමක් ද? එය රටක මිල මට්ටම හා සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 02)

iii. උද්ධමනය යනු කුමක් ද? ආර්ථික න්‍යායාට අනුව උද්ධමනයට බලපාන ප්‍රධාන හේතු මඟ විග්‍රහ කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්කම් සඳහා පාරිභෝගික මිල දර්ශකය හැරුණු විට වර්තමානයේ භාවිතා කෙරෙන ප්‍රධාන මිල දර්ශක දෙක නම් කරන්න. ඒවා පිළිබඳ කෙටි පැහැදිලි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

v. සාම්පේක්ෂණ චේතනාව මත මුදලට ඇති ඉල්ලුම යනු කුමක් ද? පොලී අනුපාතිකය හා එකී මුදල් ඉල්ලුම අතර ඇති සම්බන්ධව රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(07) i. අ) පදනම් මුදල් (අධි බලැති මුදල්) සහ මුදල් සැපයුම අතර වෙනස දක්වන්න. (ලකුණු 03)

ආ) වාණිජ බැංකු වල මුදල මැවීමට අවශ්‍ය කරන කොන්දේසි කවරේද? (ලකුණු 03)

ii. තරඟකාරී බැංකු පද්ධතියක් තුළ එක් බැංකුවක කිසියම් පුද්ගලයකු රුපියල් 2000 ක් තැන්පත් කළේ යැයි සිතන්න. සංචිත අනුපාතය 10% කි.

අ) මෙම බැංකුව අධි සංචිත සම්පූර්ණයෙන්ම ණය ලෙස සපයයි නම් මෙම බැංකුවේ අතරමැදි ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වන්න. (ලකුණු 02)

ආ) ණය ලෙස නිකුත් වූ චෙක්පත් වෙනත් බැංකුවක් වෙතට ගලා ගියේ නම් මෙම බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වන්න (ලකුණු 02)



Scanned by CamScanner

884

ඉ) සෑම බැංකුවක්ම අධි සංචිත තත්ත්වයෙන් මිදීමට ණය ලෙස සපයයි නම් අවසානයේ බැංකු ගුණකයේ (පද්ධතියේ) ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වන්න. (ලකුණු 02)

ii. අ) මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් (ප්‍රති මිලදී ගැනීම්) පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වඩාත් වැදගත් වන්නේ මතුපිට උද්ධමනයට වඩා යටිතුරු උද්ධමනයයි. (මූලික උද්ධමනය) පැහැදිලි කරන්න. (ලකුණු 03)

ඉ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන මූල්‍ය ආයතන කාණ්ඩ මහ බැංකු වාර්තාව අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 03)

(08) i. සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීම සඳහා රාජ්‍ය අංශය විසින් ඉටු කෙරෙන කාර්යයන් මොනවා ද? (ලකුණු 04)

ii. ඉදිකිරීම් ක්ෂේත්‍රයට යොදා ගැනීම සඳහා ගංගා වලින් වැලි ගොඩ දැමීම සමාජීය ප්‍රශස්ත නිමැවුම හා වෙළඳපොළ කාර්යක්ෂම නිමැවුමට ඇතිකරන බලපෑම ප්‍රස්තාර සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. අ) ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහය තුළ ඇතුළත් ප්‍රධාන බදු වර්ග මොනවාද? (ලකුණු 02)

ආ) 2016-2017 කාල සීමාව අතර ශ්‍රී ලංකාවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙනස්වී ඇත්තේ කෙසේ ද? (ලකුණු 02)

iv. ව්‍යවස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. "කලාපයේ අනෙකුත් රටවල් සමග සංසන්දනය කරන විට ශ්‍රී ලංකාවේ බදු ආදායම පහළ මට්ටමක පවතී." ශ්‍රී ලංකාවේ බදු ආදායම අඩු මට්ටමක පැවතීමට බලපෑ හේතු කවරේද? (ලකුණු 04)

(09) i. රජයේ වර්තන වියදම් යනු කුමක් ද? ආර්ථික වර්ගීකරණය අනුව එහි ප්‍රධාන සංරචක කවරේද? (ලකුණු 04)

ii. අතුරු අයවැයක් හා අතුරු සම්මත ගිණුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. රාජ්‍ය අයවැයක ස්වභාවය පරීක්ෂා කිරීමට සඳහා යොදා ගන්නා මිනුම් කවරේද? (ලකුණු 04)

iv. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ අයවැය හිඟය මූල්‍යනය කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර කවරේද? (ලකුණු 04)

v. රාජ්‍ය හිමිකාරීත්වය යටතේ පැවති ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීම, බදුදීම, කළමණාකරණය පමණක් පැවරීම නිසා ඇතිවන හිතකර හා අහිතකර තත්ත්වයන් කවරේද? (ලකුණු 04)



Scanned by CamScanner

(10) i. අන්තර් ජාතික වෙළඳාම තුළින් ආර්ථිකයක් ලබන වාසි සඳහන් කරන්න. (ලකුණු 04)

ii. ජාත්‍යන්තර වෙළඳාමේ පදනම් විශයෙන් සැලකෙන නිරපේක්ෂ වාසි මූලධර්ම සහ සාපේක්ෂ වාසි මූලධර්ම අතර වෙනස කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)

iii. සංයුක්ත සම්පත් ඒකකයක් භාවිතයෙන් චීනය සහ කොරියාව පරිගණක යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය සිදු කරයි. එහි නිෂ්පාදන තත්ත්වයන් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

| භාණ්ඩය | චීනය | කොරියාව |
|---|---|---|
| පරිගණක යන්ත්‍ර | 12 | 8 |
| රූපවාහිනී යන්ත්‍ර | 6 | 2 |

අ) පරිගණක යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි පවතින රටවල් හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) මෙම රටවල් එකිනෙක අතර වෙළඳාම සිදුකර ගනු ලැබුවහොත් වෙළඳාම සිදුවන්නේ කවර හුවමාරු අනුපාත යටතේ ද? (ලකුණු 02)

iv. අපනයන හා ආනයන ප්‍රවාහ සීමා කිරීමට හෝ මුලුමනින්ම නැවැත්වීමට භාවිතා කෙරෙන තීරුබදු නොවන සීමා කිරීම් කවරේද? (ලකුණු 04)

v. ගෙවුම් තුලන ලේඛණයේ ඉදිරිපත් වන ප්‍රධාන ගිණුම් නම් කරන්න. (ලකුණු 04)

vi. වෙළෙඳ අනුපාතිකය සහ විනිමය අනුපාතිකය යන සංකල්ප අතර වෙනස දක්වන්න. (ලකුණු 02)

Scanned by CamScanner